__අසීමිත බුදු ගුණයන්ගේ නිවැරදිව නවගුණ බල වඩමු__

__**Ingraining the powers of the Nine Nobilities from the infinite Nobilities of the Lord Buddha**__

Category: 03 සංයුක්ත තැටිය

මගේ නව අරහාදි බුදු ගුණ පිළිබඳව විස්තරයක් කරන්න ගියොත් එහෙම, **“**අප්පරමාණ බුදු ගුණ**”** ප්‍රමාණවත් ව විස්තර කරන්න බෑ. මතෙන්දි අපි දැකගත යුතු ක්‍රමයක් තියනෙවා. දැන් ඔය ත්‍රිපිටකයෙ එක තැනක තියනෙවා

If we are to explain the nobilities of the Lord Buddha beginning from the nobility of “araham”, we’d fail miserably. We can’t even begin to sufficiently describe the infinite nobilities of a Lord Buddha. We must understand something. In a certain place in the Pali Canon, this is mentioned.

“විජ්ජා චරණ සම්පන්න කියන්නෙ **මොකද?”** කියලා එක්තරා ස්ත්‍රියක් ඇවිදිල්ලා, එක්තරා භික්ෂූන් වහන්සේ නමකගෙන් ඇහුවා. “විජ්ජා චරණ සම්පන්න නිසා විජ්ජා චරණ සම්පන්න කියනවා” කියලා උත්තරයක් දුන්නා.

A woman comes and ask a Monk, “What is meant by ‘Vijja-Carana Sampanna’?” He answered, “The Lord Buddha is called ‘Vijja-Carana Sampanna’, because he has the quality called ‘Vijja-Carana Sampanna’”.

බුදුරජාණන් වහන්සේගෙන් ගිහිල්ලා ඇහුවා. “විජ්ජා චරණ සම්පන්න නිසා විජ්ජා චරණ සම්පන්න කියනවා” කියලා උත්තරයක් දුන්නා. දැන් මතෙන්දි එයින් එහා උත්තරයක් දුන්නෙ නෑ. ඒ කියන්නෙ, ඒකට නව වචනයක් දෙන්න බෑ.

She then went to the Lord Buddha and asked the same question. The Lord Buddha gave the same exact answer. No further explanation was given because it is impossible to explain its meaning effectively with other words.

ඔය වචනය, අප්පරමාණ ගුණයක් ගැබ් වෙලා තියනෙ වචනයක්, ඕක. දැන් “විජ්ජා නැණ අටද, පසළොස් චරණ ගුණයද යුතියන්ගේ එ මුණි සඳ, පිරුණු විජ්ජා චරණ නම් ලද” කියලා ඉතින් අපිට ඕවා විස්තර කරලත් තියනෙවා, දැන් අපේ කවි වලත්.

This word contains immeasurable goodness. In our poems it is however mentioned that, “The possessor of the eight theories and the fifteen practices is called the ‘Vijja-Carana Sampanna’”.

ඉතින්, **“**අෂ්ට විද්‍යා**,** පසළ**ොස්** චරණ ධර්ම වලින් යුක්ත හයින් විජ්ජා චරණ සම්පන්න කියනවා**”** කියලා. හැබැයි, මගේ විදිහට අපි කොච්චර කිවුවත්, බුදුරජාණන් වහන්සේ ගේ අෂ්ට විද්‍යා මන්න මේවයි කියලා තෝරුම් ගන්න එයා බුදු වරයෙක් ම වෙන්න ඕනෙ.

The possessor of the so called eight theories and the fifteen practices is said to be the ‘Vijja-Carana Sampanna’. We might try heavily to describe the nobilities of the Lord Buddha,

but to do that, to understand what the nobilities of the Lord Buddha are, one has to become a Lord Buddha himself.

උන්වහන්සේ ගේ පසළොස් චරණ ධර්ම මේවයි කියලා තේරුම් ගන්න නම්, ඒ ජාතියෙම බුදු වරයෙක් ඕනෙ. තව කෙනෙකුට ඒක තේරුම් ගන්න බෑ. දැන් අපි හිතමු, සාමාන්‍ය නිකන් අපි ලෞකික අදහසක් අරං, යම්කිසි උපාධිධාරියෙක්,

To understand the so called fifteen practices of the Lord Buddha, one must be a Lord Buddha in the first place. No one else is able to do that. Let’s consider a simple analogy. Take a graduate teacher.

විද්‍යා ගුරුවරයෙක් ඇවිදිල්ලා ළමයෙකුට මොනවා හරි උගන්වනවා. බාල පංතියෙ ළමයෙක්ගෙන් විද්‍යාව ගැන කියලා දෙනකොට, “විද්‍යාව සර් හරි දක්ෂයි, විද්‍යාව ගැන දන්නවා…” කියලා ළමයා කියන්න පුලුවන්, ළමයගෙ මට්ටමෙන්.

A science teacher, we’ll say. He comes and teaches a student in the primary school. The student becomes so impressed with the teacher and begin to praise the teacher saying how skilled he is, how knowledgeable he is about the subject matter etc.

හැබැයි, ළමයා විද්‍යාව සර් ගෙ දක්ෂතාවය දැකල ද කිවුවෙ? ඒ ළමයා දන්නවද “විද්‍යාව සර් මෙතෙකින් දක්ෂයි” කියලා කියන්න? “එයාගෙ දක්ෂතාවය මෙන්න මෙච්චර පැතිරිලා තියෙනවා,

The student gives his feedback from his level of understanding, he is unable to fully grasp the entirety of the skills and knowledge of his science teacher. How could he know, the small kid?

එයාගෙ මනසට මෙන්න මෙච්චර විද්‍යා කරුණු ගෝචර වෙලා තියෙනවා, ඒ අනුවයි මම කියන්නෙ අපේ ගුරුවරයා විද්‍යාවට මෙච්චර දක්ෂයි කියලා..” කියන්න එහෙම ගෝලයට පුලුවන්ද? එහෙම කියන්න ක්‍රමයක් නෑ.

Some amount if scientific knowledge is workable to his limited understanding. Based n that only he decides that his teacher is skilful. The student simply can’t measure the skill level of the teacher, it isn’t feasible.

එක්තරා විශ්වාසයක් තියෙනවා, “ඒ ගුරුවරයා විද්‍යාව පිළිබඳව හොඳ, හසළ දැනුමක් තියෙන කෙනෙක් කියලා මට විශ්වාසයි…” හැබැයි, තරම කියන්න පුලුවන් කමක් නෑ, විස්තර කරන්න බෑ. මෙන්න මේ වගේ, මේ ගුණ පද වලට තව වචන දාන්න බෑ.

He has a bit of a belief that the teacher ought to be the possessor of a good amount of scientific knowledge. But to what extent exactly he can’t know. He can’t explain how much it is. Similarly, we can’t substitute these terms that are describing the nobilities of the Lord Buddha.

මේ තමයි **“මූල භාෂාව”**, මනුස්සයා ගේ මූල භාෂාවෙ පද. මේ මූල භාෂාවෙ පද හැදිලා තියෙන්නෙ **“ගති හඬෙන්”**. “ගති ගුණයන්” නැගෙන “ගති හඬ”. ඒවා බුදුරජාණන් වහන්සේ ගේ තිබෙන්නා වූ ගතිගුණ පිළිබඳව,

The is the root language that all languages come from. The words in this root language have originated from the innate sound, the innate sound that comes from the innate qualities. The innate sound representing the nobilities if the Lord Buddha.

ඒ ගති ශබ්ද පදය, බුදුරජාණන් වහන්සේට ම ගෝචර වෙලා තමයි ලෝකෙට පිටවුනේ. එහෙනම්, ඒ පදය ඇසුරු කරනකොට ඒ පදය තුළ තියෙන හැඟීමට ක්‍රම-ක්‍රමයෙන් අපේ මනස ලංවෙන්න පටන් ගන්නවා.

The appropriate term has been understood by the Lord Buddha, uttered by the Lord Buddha. Our minds begin to being compatible to the emotion entailed in that expression, the more we associate ourselves with the word.

ඒක වෙන්නෙ මොකක් නිසාද? අපිට අමතක වෙච්ච දෙයක් තියෙනවා, එක්තරා භාෂාවක්. ඒ භාෂා රටාව අපිට අමතකයි, අද. මේ ලෝකෙ සියලුම සත්වයෝ මේ “ශුද්ධ මාගධී” කියන භාෂාව කතා කරනවා, කාලයක්.

Why does it happen this way? There is something that we have forgotten. A particular language, which we no longer remember. But once upon a time, all the different animals that we see today used to speak the dialect. The pure Magadhi language.

අන්තඃකල්ප 80 ක් මේ ලෝකෙ, “මහා කල්පයක්” කියන එකට අන්තඃකල්ප 80 ක් කියන කාලයක් තියෙනවා ලෝකයක් හටගැනීමට, හටගෙන පැවතීමට, විනාශය කරා ගමන් කිරීමට, විනාශ වෙලා පැවතීමට කියන.

The great-aeon (Maha-kalpa) comprises of 80 intra-aeons (antah-kalpas). Within these 80 Antah-Kalpas, the world cyclically gets created, exist, goes into destruction and stay destroyed.

මෙන්න මේ “මහා කල්පයක්” කියන කාලයක් තුළ, ඔය අන්තඃකල්ප 20 න් 20 ට ඔය කාලය යනවා. මේ ලෝකෙ විනාස වෙන කාලෙදි මේ ලෝක සත්වයෝ **“ආභස්සර”** කියන බ්‍රහ්ම ලෝකයේ උපන්නට පස්සෙ,

Within the maha-kalpa, the world goes through the four stages at the interval of the 20 antah-kalpas and while the earth is being destroyed and stays so, the beings get reborn in the Brahma world called “Abhassara”.

ලෝකෙ විනාස වෙලා තියෙන අන්තඃකල්ප 20යි, ඊට පස්සෙ යළි හටගනිමින් තියෙන අන්තඃකල්ප 20යි, ඔය අන්තඃකල්ප 40 ම ඉන්නෙ එහෙ. අනිත් සැරේ හැදෙන අන්තඃකල්ප විස්සෙ, හැදෙන කාලෙදි තමයි එහෙන් මෙහෙට එන්නෙ.

The 20 antah-kalpas when the earth is being destroyed and the following 20 antah-kalpas when the world stays destroyed, the beings reside there and falls back to the earth during the following 20 antah-kalpas, when the earth begins to take its shape.

මෙහෙට ඇවිදිල්ලා, මේ හැදිච්ච කාලෙ ජීවත්වෙන කාලෙ තමයි මේ භාෂා පරිවර්තන හදාගෙන, මූල භාෂාව මතක නැති වෙලා, අපි හදාගත්ත භාෂා තුළින් අපේ ජීවිතය ගෙනියන්නෙ, අදහස් හුවමාරු කරගෙන.

When they fall back to the earth, they begin to lose touch of the rot language and start to communicate in the many different dialects that we see today.

එහෙනම්, මේ හටගෙන පවතින කාලසීමාව වන අන්තඃකල්ප විස්සෙ තමයි මේ සියලුම භාෂා මේ ලෝකෙ බිහිවෙලා තියෙන්නෙ. ඉංග්‍රීසි කිවුවත්, ලතින් කිවුවත්, දෙමළ කිවුවත්, සියලුම භාෂා කිවුවත්,

So it's only during these 20 antah-kalpas, the beings would use these different languages, let it be English, Latin, Tamil or any other language.

ඔය හැම එකක්ම විවිධාකාර භාෂා බවට පත්වෙලා, මිනිහා ඒ තුළ ජීවත් වෙලා, අදහස් හුවමාරු කරගන්නෙ ඔන්න ඔය ලෝකය හටගෙන, පවතින කාලය තුළ, අන්තඃකල්ප විස්ස තුළ.

Different dialects come in to being and humans use them to converse with each other during these 20 antah-kalpas while the earth is in existence.

මෙතෙනින් ගිය තැන පටන් "ශුද්ධ මාගධී" භාෂාව කතාකරගෙන තමයි මේ සියලුම ලෝක සත්වයෝ ජීවත් වෙන්නෙ. ඒක කවුරුවත් උගන්වන භාෂාවක් නෙමෙයි. "සත්වයාගේ මූල භාෂාව" කිවුවෙ ඒකයි, සහ "මාගධී මූල භාෂාව".

The moment they leave the earth, they use their customary root language, the 'pure magadhi' language. No one needs to teach them. That is why it is termed as the 'primordial dialect of all beings', the primordial Magadhi dialect.

සත්වයින්ගේ මූල භාෂාව – ඔය මූල භාෂාව, දාන මොන්ටිසෝරිත් නැ, ළදරු පාසැල් නැ ඕවා උගන්වන්න. භාෂා ශාස්ත්‍රය, ව්‍යාකරණ ශාස්ත්‍රය උගන්වලා කියන එකක් නෙමෙයි. අද කූරා කූහුඹුවා වෙලා ඉන්න එකා ත්, පළඟැටියා වෙලා ඉන්න එකා ත්

There are no kindergartens to teach them, no grammar classes, elocution classes, even the ants, the locusts that we see today, would have used the same dialect, as a Brahma.

එදා ඔය භාෂාව කතා කරපු, අර බ්‍රහ්ම කල්පිය, බ්‍රහ්මයෙක්. එහෙමෙ කාලයක් ඒ සත්වයින්ටත් තිබුණා. මේ ලෝකය හටගෙන, පවතින කාලය තුළදී ඇතිවෙන පුද්ගලයා විසින්, මේ රාග, ද්වේෂ, මෝහ නිසා, ලෝභ, ද්වේෂ, මෝහ ආදියෙන් දූෂණය වීම නිසා

Even these trivial beings once were born as Brahmas. The beings that are born here on earth while the earth is in existence are subjected to greed, hatred and delusion and get corrupted.

ඇතිකරගත්තා වූ පහත් අත්බැවු ලබාගත්ත මේ කාලෙ තමයි සත්තු වෙලා ඉන්නෙ. සතාට ඒවා එකක් වත් කරගන්නත් බැ. මනුස්සයෝ වෙලා ඉන්න මට්ටමට ඉන්නතේ රාගය මුල් කරගත්ත අදහස්, "මිනිස් සංඛාර" නිසා.

Resulting in inferior rebirths as animals. The animals now can't do any of that. Even to remain at the level of humans, the human mental fabrications driven by greed would have been based.

එහෙනම්, මේ ලෝකෙට ආවට පස්සෙ භාෂා විපර්යාසයන්ට පත්වෙලා, එක එක භාෂා කථා කරනකොට, මුල භාෂාව ඔක්කොටම අමතකයි. හැබැයි, මුල භාෂාවට එන්න නම්, "අලෝභ, අද්වේෂ, අමෝහ" කියන "ගුණය" වැඩෙන්න ඕනෙ.

Following the descent to the earth and changing into different dialects the root dialect has been forgotten. To get back into terms with it, one needs to cultivate the nobilities of alobha (non-greed), adwesha (non-hatred) and amoha (non- delusion).

දැන් ඒකෙන් පිරිහිච්ච නිසා තමයි "මුල භාෂාව" පිළිබඳව අපිට හැඟීම් එන්නෙ නැත්තෙ. නමුත්, අලෝභ, අදෝස, අමෝහ ගුණයෙන් "බ්‍රහ්ම ගතිගුණයට" එනකොට, ක්‍රම-ක්‍රමයෙන් අර ආදි මුල භාෂාවේ හැඟීම එන්න පටන් ගන්නවා, ඒ වචන ප්‍රකාශ කරනකොට.

Since we are full of greed, hatred and delusion, the emotions aren't occurring in the root dialect. The nobilities of non-greed, non-hatred and non-delusion, brings back the Brahma qualities, giving rise to the emotions of the root dialect, while those words are pronounced.

දැන් "අරහං" කියන වචනය භාවිතා කළොත්, රාගක්ෂය වූ, ද්වේෂක්ෂය වූ, මෝහක්ෂය වූ බුදුපියාණන් වහන්සේ ගේ ගති ලක්ෂණයක් තමයි "අරහං" ගති ලක්ෂණය. "අරහං" කියන ශබ්දයෙන්, ගුණ පදයෙන් කියවුනේ අන්න ඒ ගුණය.

If we use the word "Araham", it points to a nobility of the Lord Buddha who has eradicated the greed, hatred and delusion. The word "Araham", indicates that quality.

එහෙනම් වීත රාගී, වීත දෝසී, වීත මෝහී ගුණයක් ඇසුරු කරනකොට, ක්‍රම-ක්‍රමයෙන් ඒ ගුණයේ, ගුණ පදය තුළින් ගුණ හඬ තුළින්, අපි ගෙනියනවා ඒ ගුණය කරා. මේක "ගති හඬ". ගති හඬ තුළින් ගෙනියනවා ගති ගුණය කරා.

When the nobilities of non-greed, non-hatred and non-delusion are being associated, gradually we are introduced to the innate qualities represented by the innate sound pattern. The innate sound leads to the innate quality.

එහෙනම්, "ගති හඬ" භාවිතා කරනකොට, අපේ හිත "ගති ගුණය" කරා යනවා. අන්න ඒක උපක්‍රමයෙන් පිරිසිදු කරනවා කිවුවෙ ඔන්න ඕකයි. බුදු ගුණ සිහි කරනකොට උපක්‍රමයෙන් කිලිටි හිත පිරිසිදු වෙනවා කිවුවෙ ඔන්න ඕකටයි.

While we use the sound, our minds are driven to the quality it represents. Thus, tactically purifying our minds. Therefore, it is said that our minds are purified while the nobilities of the Lord Buddha are recollected.

එතකොට, වීත රාගී, වීත දෝසී, වීත මෝහී මේ ගුණ පදය සිහි කරගෙන යනකොට, එයා දන්නෙ නෑ සුද්ධ වෙන බව. දැන් රෙද්දට අවශ්‍යය රසායනය දාලා හෝදනකොට, රෙද්ද දන්නෙ නෑ රෙද්ද සුද්ධ වෙන බව. කුණු දන්නෙ නෑ,

The person who is rehearsing these innate expressions of non-greed, non-hatred and non-delusion might not know, but they do take their effects purifying the mind, just the same way as a dirty cloth gets purified when some detergent is applied.

කුණු අර රසායනය නිසා පොඟලා, ඉවත් වනෙ බව, මේක ධර්මතාවයක්. ඒ ධර්මතාවයේ පරිදි කුණු ඉවත් වනෙවා, රෙදෙද සුද්දධ වනෙවා. එතකොට, මේක තමයි සිද්දධ වනෙ සිද්ධිය.

The nature of dirt getting soaked in the detergent and getting removed is bound to happen. No need for the cloth or the dirt to know it at all. This is what's happening here.

කරන පුද්ගලයා ඒ අවශ්‍යය කරන රසායනය හරියට දැම්මා නම්, ඒ ක්‍රියාවලිය හරියට කළා නම්, රෙදෙද සුද්දධ වනෙවා. වුනාට පස්සෙ, වුන බව දන්නවා. මතේන මේ වගේ, අපිත් ඒ රෙදෙද අපුල්ලනවා වගේ,

If the person who is washing the cloth applied the detergent properly, the cleansing process takes effect on its own and once cleansed, it becomes apparent.

"හිත" නැමැති රෙදෙද අපුල්ලන්න ඕනෑ මේ පදය නැමැති රසායනය දාලා. ඕක තෝරන්න ගියොත් එහමෙ අපිට වැඩේ කරගන්න හම්බවනේනෙ නෑ. සබන් කෑල්ල හදලා තියනේනෙ මොන රසායන වලින්ද කියලා හොයන්න ගියොත් එහමෙ

Similarly, the cloth called the mind must be subjected to the detergent called these innate expressions. Wasting time to decipher these expressions is equivalent to analysing the chemical composition of the detergent.

එයාට රෙදෙද හෝදගන්න හම්බවනේනෙ නෑ. ඔය එකක් වත් දන්නෙ නැති, සාමාන්‍ය මට්ටමේ ඉන්න කාන්තාවකට පුලුවන්, "සන්ලයිට් කෑල්ල" අතුල්ලලා, රෙදෙද හෝදගන්න. හැබැයි, "සන්ලයිට් කෑල්ල" හදලා තියනෙ රසායන සංයුතිය දන්නෙ නැතුවට,

He wouldn't be able to get the cloth washed. An average woman with less than average intelligence would be able to wash the cloth effectively without knowing anything about the chemical aspects of the soap.

රෙදෙදෙ කුණු යනවා ඒ කෑල්ලනේ හෝදනකොට. මතේන මහෙමෙ දයෙක් තමයි මේ ගුණ පද කියන්නෙ. මේවා එක්තරා ලෝකෝත්තරත්වය කරා ගනෙියන, ලෞකික කහට කපන, "රසායන පද", රසායන කෑලි.

When the soap is applied, the dirt gets removed. The expressions of the Nine Nobilities work the same way. These are the cleansers that would get the defilements off your minds.

ඕක හරියට තෝරාගත්තහම අපිට ඔය ප්‍රශ්නෙ නෑ. දැන් මේ "අරහං, සම්මා සම්බුද්දධ, විජ්ජා චරණ සම්පන්න, සුගත..." පද වනේ කරලා කියන්න ඕනෑ. ඉතින් "ඉතිපිසෝ හගවා..." මහොම ගත්තම "ඉතිපිසෝ" කියලා පදයක් ඇත්තේ ම නෑ.

If we get this clarified there wouldn't be any problem. We also have to keep intervals between each of the nine expressions. "Araham, Samma-sambuddha, Vijjacarana-sampanna, Sugata …". Some would chant "ItipisoBhagava", which is very wrong.

අර ගුණ නවයනේ යුක්තයි කියලා පනේනපු "මසෙෝ හයේන් ඒ භාග්‍යවතුන් වහන්සේ..." කියන එක තමයි "ඉතිපි සෝ හගවා" කිවුවෙ. නමුත් මුල ම කාලා දැන් තියනේනෙ...නව අරහාදි බුදු ගුණ අරගනෙ,

"Itipi so Bhagava" means (Itipi – Ishta praptha- The one who has attained the most agreeable state), "because of these reasons, the Blessed one"; (Itipiso – the one who has wiped off the agreeable qualities).

බුදු ගුණ කර්මස්ථානයක් වශයනේ වඩන්න ගිහාම, “ඉතිපිසෝ භගවා…” කියලා පටන් ගන්නකොටම “ඉතිපිසෝ” කියලා වචනයක් නෑ, කියපු මුලු අර්ථය ම කැපුනා එතනින්, රසායනය වනෙස් වුනා. එතකොට ප්‍රතිචාර දක්වන්නෙ නෑ.

In the correct meditational phrase, there is no word called “Itipiso”. When you chant this way, the cleanser gets deformed, the desired results wouldn’t come about.

ඊලඟට කොහෙ ගිහින් බැලුවත් “ඉතිපිසෝ භගවා” මයි කියන්නෙ. හැමහැනම අහලා බැලුවොත්, “ඉතිපි සෝ භගවා” (“ඉතිපි” සහ “සෝ” අතර ඉඩ තබා) කියලා ශබ්ද කරන්නෙ නෑ.

Wherever you go, everyone chants “Itipiso bhagava”. One should leave a space between “Itipi” and “so”. They don’t pronounce it properly.

දැන් මං මහදෙ හුඟාක් දනෙකුෙට කියලා, කියලා, හුරු කරලා හින්දා දැන් එක්තරා මට්ටමකට පිරිසක් ඒ විදිහට ගන්නවා. නමුත් “ඉතිපි” කියලා පොඩ්ඩක් නවත්තලා “සෝ භගවා” කියලා කියලා කියනවා,

Here of course after correcting them so many times, now everyone has got used to pronounce it properly. Recite “Itipi”, leave an interval and then recite “so Bhagava”.

ඒත් “ඉතිපිසෝ භගවා” කියලා ම අනිත් අය කියනවා. මොකද, ඒක කොච්චර කිවුවත් තව තේරෙන්නෙ නෑ. ඉතින් “ඉතිපිසෝ භගවා” කිවුවම, එහමෙ පදයක් ගලපන්න බැරුව යනවා, පද ගැලපීම නැතුව යනවා.

The others continue to utter “Itipiso bhagava”. Despite continuous reminders, they don’t seem to get it. The term “Itipiso bhagava” isn’t matching to the great nobilities of the Lord Buddha.

පද ගැලපීම නැත්නම් අර කර්මස්ථානයට බාදකයි. ඒ නිසා “ඉතිපි සෝ භගවා අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජා චරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසධම්මසාරථී…” පදය සම්පූර්ණයනේ ම ගන්න ඕනෙ.

It becomes a hindrance to the meditational phrase. “Itipi so Bhagava; Araham, Samma-Sambuddho, Vijja-Carana Sampano, Sugato, Lokavidu, Anuttaro Purisa Dhamma Sarathi, Sattha Deva-Manussanam, Buddho, Bhagavati”.

“…සත්ථා දේවමනුස්සානං, බුද්ධෝ, භගවා ති” අන්න, පදනේ පදේ වනේ කරලා ගන්න. දැන් පළෙක් අය ඔතන අරගන්නකොට අර “අනුත්තරෝ, පුරිසධම්මසාරථී” දකෙට කඩනවා – නව ගුණ, දහ ගුණ කරනවා.

Each expression has to be recited keeping distinct intervals. Some others divide the expression “Anuttaro Purisa Dhamma Sarathi” as “Anuttaro” and “Purisa Dhamma Sarathi”. It results in 10 Nobilities rather than 9.

දැන් ඔය “බුදුගුණාලංකාරයේ” ත් නව ගුණ, දහ ගුණ කරලා ලියලා තියනේනෙ. “අනුත්තරෝ” කියන එක එක පදයක් වශයනෙුයි, “පුරිසදම්මසාරථී” කියන එක තව පදයක් වශයනෙුයි අරගනෙ තමයි

Even in the ancient text called “Budugunalankara” this mistake has been made. “Anuttaro” has been interpreted as a distinct term and “Purisa Dhamma Sarathi” interpreted separately.

ඉතින් එච්චර පණ්ඩිතයන් වහන්සේලා ත් නවගුණ ලියන්න ගිහිල්ලා දහගුණ කරලා ලියලා තියෙන්නෙ. ඉතින්, “අනුත්තරෝ පුරිසධම්මසාරථී” කියන්නෙ එක පදයක් (ගුණයක්).

Even such scholarly monks have made mistakes, creating 10 Nobilities rather than the nine that we know of. “Anuttaro Purisa Dhamma Sarathi” is one expression pointing to a distinct nobility of the Lord Buddha.

ඉතින් ඔය කියන රටාවල් අපි වෙනස් කරොත් අපිට ඕනෑ හැටියට, ඒකෙ තියෙන “ගුණ බලය” ලබන්න බැරුව යනවා. ඒක අපි හරියට, ඒක වචන, අකුරු හරියට ශබ්ද වෙන්න, ඒකට අවශ්‍යය කරන අදින ප්‍රමාණයෙන්,

If we change the sound patterns the way we want, its innate power wouldn’t actualise. One needs to pronounce the letters properly, extending or not extending over more than a single beat as appropriate.

දීර්ඝ අක්ෂරයක් මාත්‍රා දෙකයි, කෙටි අක්ෂරයක් මාත්‍රා එකයි, හල් අක්ෂරයක් මාතා භාගයයි කියන ක්‍රමයක් තියෙනවා. දැන් මේ ක්‍රම අද වැහිලා තියෙන්නෙ. එහෙනම් එක එක්කෙනා හිතූ – හිතූ මනාපෙට ගාථා සජ්ඣායනා කරනවා.

An extended vowel sound would go for 2 counts and a normal vowel sound for 1 count. And half a count in case of consonant sounds. This methodical usage of phonetics has been concealed nowadays. One can’t recite chanting the way he wants.

හිතූ – හිතූ ලෞකික තාල ඒවට ආරෝපණය කරලා ලස්සන වෙන්න කියනවා, හැඩ වැඩ වෙන්න කියනවා. තමන්ගෙ මූබරි කම නිසා එක එක විදිහට ශබ්ද, මහප්‍රාණ කරලා කියනවා.

One can’t use different phonetic features to make the chanting melodious, making them aesthetically appealing by using pitch gestures etc.

ඉතින් එහෙම කියන්න පටන් ගත්තම ඒකෙ තියෙන ගැලපීම නැතුව යනවා. මහප්‍රාණයේ මට්ටමට එහා මහප්‍රාණ කරන්න හොඳ නෑ, අල්පප්‍රාණයේ මට්ටමට එහා පහත් කරන්නත් හොඳ නෑ.

If these sorts of methods are used, it is not compatible with the spirituality. The high pitch should not be overly increased, and the low pitch should not be overly decreased.

එහෙම කරපුහාම, ඉතින් අද කියන ඒවා මං අහලා තියෙනවා, මට හැමතැනින්ම කර්මස්ථාන ඇහෙන ඒවත් තියෙනවා, අපේ ඒ විශේෂ හාමුදුරුවරුන් ගේ, ඉතින් අර ගුණ කියනකොට, “..අරහං වන සේක…” කියලත් කියනවා.

I have heard here and there, some meditational phrases even. Some monks pronounce as “Araham /vəˈna/ seka” instead of “Araham /wʌna/ seka”.

“වන සේක” කියන එකේ “ව.. ව” කරනවා. (නිවැරදි ශබ්දය පිටපත් කළ නොහැකිය, එබැවින් කරුණාකර දේශනාවට සවන් දී නිවැරදි ම හඬ අසන්න). ඉතින් “වන සේක” කියලා වචනයක් නෑ, “සම්මා සම්බුද්ධ නම් වන සේක…” මේ

The sound /və/ has been changed to /wʌ/. There is no word called “/vəˈna/ seka”. “Samma Sambuddha /wʌna/ seka”. See.

“වන” කියලා වචනයක් භාවිත වෙන්නෙ නෑ. අන්න ශබ්ද වෙනස් ඒවා. ශබ්ද කළ යුතු වචනය ශබ්ද කරන්නෙ නැතුව, ඒක පහත් කරලා ගන්නකොට, ඉතින් ඒවා අපිට අඩුපාඩු වෙනවා.

There is no word sounding “/vəˈna/”. The sound is different. When the sounds are not pronounced properly that would become a hindrance when they are used as spiritual tools.

මොක්ද, “ගුණ හඬ” හරියට එන්න ඕනෙ. “ගුණ හඬ” හරියට ආවෙ නැත්නම්, “ගති හඬ” හරියට ආවෙ නැත්නම් “ගති ගුණ” මතුවෙන්නෙ නෑ. ඉතින් එතකොට “ඉතිපිසෝ….. හා…ගවා…” කිවුවට හරියන්නෙ නෑ.

Because the innate sound should come about in order for the innate qualities to emerge. If one pronounce “Ithipisooo….bhaaa…gawaaa…”, that would not be in conformity.

ඒකෙ අවශ්‍යය කරන මට්ටමක් තියෙනවා. ඉතින් මේවා අද හැඟවිලා නිසා, මේ ශාස්ත්‍ර, මේකෙන් මතුකරගන්න විදිහක් නෑ මොකද්ද ඒ පදයට ගන්න “දීර්ඝ අක්ෂරයට මාත්‍රාව” කියන්නෙ මොකද්ද?

There is a certain level as to how fast or slow a chanting should be recited. The proper usage of phonetics should be used. One should know the appropriate number of counts for each sound.

මාත්‍රා දෙකෙකට වැඩිය කියනවා නම්, මාත්‍රාවක ප්‍රමාණය කොච්චරද? දැන් මේවා දැනගන්න ශාස්ත්‍ර අද නැති නිසා මේ මාත්‍රා ගැණගන්න දන්නෙ නෑ. මාත්‍රාවක දීර්ඝ ප්‍රමාණය කොච්චර වෙලාවක් යනකල් දීර්ඝ ද?

One should know what the measure of a count is if more than one count is used. Don’t know how to ascertain the duration of a count.

කොහොමද මාත්‍රාවක ශබ්ද දීර්ඝත්වය දැනගන්නෙ? මාත්‍රා දෙකෙක ශබ්ද දීර්ඝත්වය කොච්චර මට්ටමකට ද තියෙන්නෙ කියලා දැනගන්නෙ? ඒ ශාස්ත්‍රය වැහිලා නිසා අද හොයාගන්න බෑ.

How long a count should be for? How long an extended vowel sound be recited? Because the science of phonetics is concealed, one can’t know easily.

මොකද, මේක පොත්-පත් වල අද මේක වැහිලා තියෙන එකක්. පොත්-පත් වලත් නෑ, අටුවා නෑ, මොකද “හෙළ අටුවා” දැන් නෑ. “හෙළ අටුවා” වල ඕවා තිබුණා, නමුත් අද “හෙළ අටුවා” ඔක්කොම හංගලා, විනාස කරලා දාලා.

The books that are referred today, don’t include these things. The ancient Sinhalese commentaries aren’t there anymore. They contained these sciences. All of them have been hidden or destroyed.

ඒ නිසා ඒ වැදගත් ශාස්ත්‍රය නැතිවෙලා ගිහිල්ලා තියෙනවා. ඉතින් ගාථාව හලලා, කරලා, අපිට ඕනෙ හැටියට එක එක රටා, රටා අරගෙන, එහෙමෙ රඟපාන්න යන්න බෑ. එතකොට කියන්න පුලුවන්,

Therefore, we have been deprived of valuable knowledge. We can’t put aside the proper way to recite chants and go for theatrical voicing.

අහගෙන ඉන්නත් පුලුවන්, ඒ “ගති හඬ” ලැබෙන්නෙ නැතිවෙලා, “ගති ගුණය” පහළවෙන්නෙ නෑ. “ගති ගුණය” නැත්නම්, අවශ්‍ය සමාධිය නැගෙන්නෙ නෑ. ඒකයි කාරණය.

We might be able to hear nicely. However, without the proper sound, the desired qualities wouldn’t be induced. Thus, the desired Samadhi would not be attained.

ඒත් අකුරු ගණින ක්‍රමය තියනෙවා, අකුරක් ගණිනකොට ඒකට යන මාත්‍රා ගාණ ගණින ක්‍රමයක්. යම්කිසි ගාථාවක් කියනකොට, ගාථාව මාත්‍රා කීයක් තියනෙවද? මේ හලෙ අටුවා නැති නිසා අපිට මේක හොයාගන්න බැරුවට,

There is a method to count letters. The counts attributable to each letter. When a certain chant is recited, how many counts are relevant to that chant? With out the commentaries we can’t find out.

නමුත් ඉතින් ඕක හොයාගන්න ක්‍රම අපි ඇසුරු කරලා, හොයාගෙන තියනෙවා. අපි හිතමුකෝ, නවගුණ ගාථාව කියනකොට, “ඉ” “ති” “පි” අකුරු තුනක් කියවුනා. “සෝ” කිවුවහම දීර්ඝ අක්ෂරයක්. දීර්ඝ අක්ෂරයක් මාත්‍රා 2 යි.

We have found out the way to find it. When we recite the chant of the Nine Nobilities, suppose we say, “i” “thi” “pi”, three letters are voiced. “So” is an extended sound, which takes 2 counts.

“ඉ” “ති” “පි” “සෝ” කියනකොට, මාත්‍රා ඔක්කොම තුනයි, දකෙයි, පහක් 5 ක් කියවුනා. “භ” “ග” “වා” භ යන්නට එකයි, ග යන්නට එකයි, වා යන්නට මාත්‍රා දකෙයි, දැන් මාත්‍රා 4 ක් කියවුනා. “අ” “ර” “හං” කිවුවම එකක් එන්නෙ, එක අකුරක්.

“i” “thi” “pi”, “so” requires 3 counts plus 2 counts: 5 counts in all. When we say “bha” “ga” waa”, it requires 2 counts for “bha” “ga” and 2 counts for “waa”: 4 counts in all. In “a” “ra” “ham”, “ham” takes only 1 count.

ඒ නිසා අ යන්නට එකයි, ර යන්නට එකයි, හං කියන එකටම එකයි මාත්‍රා 3 යි එතන. ඔය විදිහට මාත්‍රා ගණින්න ඕනෙ, මේ නව ගුණයන්ට ම තියනෙ. ගැණපු මාත්‍රා ගාන අරගනෙ, අපි ගාථාව කියන්න විනාඩියක් ගියා නම්,

a” takes 1 count, “ra” takes 2 counts and “ham” takes only 1 count: 3 counts in all. Likewsie we need to calculate the number of counts it takes to chant all 9 nobilities. If it takes 1 minute to recite the entire chant,

විනාඩියක් කියන්නෙ තත්පර 60ක් නෙ, අර තත්පර 60 අර ආපු මාත්‍රා ගණනනේ බදෙපුහාම, අන්න විනාඩියක් තුළ මේ ගාථාව කිවුවා නම් තත්පර කීයක් මාත්‍රාවකට එනවද කියලා බදෙපුහාම තත්පර ගණනනේ එනවා.

Since, 1 minute is 60 seconds, if we divide 60 with the number of counts, we calculated, we’d find out the time we need to spend to utter each count of the chant.

ඕන්නම් විනාඩි දකෙකින් මේක කියන්න පුලුවන්, ටිකක් ඇදගෙන. එතකොට තත්පර 120 බදෙන්න ඕනෙ අර ආපු මාත්‍රා ගණනින්. අන්න එතකොට මාත්‍රාවකට අවශ්‍යය කරන තත්පර ගණන එනවා, කාල සීමාව.

If we want to voice the chant over 2 minutes, a bit slowly, we need to divide 120 with the number of counts of the chant. Thus, we can find out the duration of each count.

අන්න මාත්‍රාවක කාල සීමාව. ඉතින් ඒ නිසා එහමෙ ශාස්ත්‍ර ක්‍රමයකින් තමයි මේක දකින්න ඕනෙ. නමුත් “සමාධියතේ” හඬ නැගනෙකොට, ඕවා ගොත ගොතා කියන්න ගිහාම හරි අමාරුයි, ඕකෙ න්‍යාය ධර්මය ඔය කියන්නෙ.

We need to use this technique to chant properly to facilitate the anticipated “samadhi”. If we are to melodize the chants, the purpose of the chanting won’t be achieved.

සමාධියතේ නම් ඒ ගාථාව කිවුවෙ, ඔය ක්‍රමයට ම තමයි හඬ නැඟිලා එන්නෙ, ඒක වෙනස් වෙන්නෙ නෑ. ඉතින් අන්න ඒ ක්‍රමයට ගන්න ඕනෙ, වේගෙන් කියන්නත් පුලුවන්, හයියතේ කියන්නත් පුලුවන්, හිමින් කියන්නත් පුලුවන්, ඇදලා කියන්නත් පුලුවන්,

If the chant is uttered, through a Dhamma samadhi, the sounds would come out in the proper way. We can utter the chant slowly or faster as preferred.

හැබැයි මාත්‍රා වෙනස් කරන්නෙ නැතුව කිවුවහම පදයක්, පදයක් ගානෙ, අකුරක්, අකුරක් ගානෙ හරියට හැඟීම, තේරීම එනවා. **කොච්කර වේගෙන්** කිවුවත් පැහැදිලියි.

But, without changing the relevant counts, with each word, the innate emotion can be understood. It becomes clear despite how faster we chant.

ඒ “සමාධි **හඬකට**” මිසක් ඒක අල්ලන්න බෑ, වේගෙන් කියන්න ගියොත් හැමතැනම පැටලනෙවා. සමහර ඒවා දීර්ඝව කියවනෙවා, සමහර ඒවා ඉක්මනට කියවනෙවා, එතකොට වචන පැටලුනහම අර්ථය ගන්න බෑ.

Only a person with a Dhamma samadhi could utter clearly, despite how faster he is chanting. No words get twisted. If the words gets twisted, the correct understanding doesn’t come out.

දැන් පේනවා ඇති, දැන් අපි අර අනුමෝදනා දේශනාව කරනකොට, ඔය කොච්චර වේගෙන් කියවනෙවද? මෝටෝ් සයිකලේ ස්ටාර්ට් කරපුහාම යන සද්දෙ වගේ, ඒ තරම් වේගවත් අකුරු, වේගෙන් කියාගනෙ යනවා.

During the merit-transference we normally, utter words very quickly. Sometimes it would sound like a motorcycle engine starting to run. It’s quite fast, the words are voiced faster.

නමුත් කියන ඒවා හොඳට තේරෙනවා අහගනෙ ඉන්න එක්කනොට, අවධානය විතරයි ඕනෑකම තියන්නෙ. “මේ මේ කාරණය යි මේ කියන්නෙ” කියලා එක එකක් නැර තේරෙන්න පටන්ගන්නවා.

But the listeners can understand if they are attentive. They can distinctively recognise what is said, one after the other without any confusion.

පලවෙනි දවසෙ අවධානයතේ හිටපු මනස යොමුවෙලා නැත්නම් එක දවසක්, දෙකෙක් යනකම් තේරෙන්නෙ නෑ, ටිකක් අඩුයි. ආයි අවධානය යොමු කරලා අහනකොට හොඳට පැහැදිලිව තේරෙනවා කොච්චර වේගෙන් කිවුවත්.

On the first or second day, if they aren’t attentive, they might not understand perfectly. But afterwards with attention they can understand what is uttered, it doesn’t matter how fast the things are said.

තව වේගෙන් කිව්වා නම් තවත් අහන්න පුලුවන්, තේරුම් ගන්න පුලුවන්. හැබැයි ඔය මාත්‍රා ගණන හරියට වෙනස් වුනා නම්, ඔය තේරුම එන්නෙ නෑ. ඉතින් මේ මාත්‍රාවේ අංශු මාත්‍රයක් වෙනසක් නැති වේගය කොච්චරද කියනවා නම්,

If the tempo is further increased there wouldn't be much problem. But if the number of counts is tampered with, the understanding gets distorted. If there's no alteration in the number of counts, there is no problem.

අපි වචනයක් කතා කරනකොට ලොවුතුරා බුදුරජාණන් වහන්සේට වචන **512** ක් කියන්න පුලුවන්. අපි වචනයක් කතා කරන වෙලාවට සැරියුත් හාමුදුරුවන්ට වචන **64** ක් කතා කළහැකියි.

This is why, the Lord Buddha is able to utter 512 words, when we'd utter just a single word. The Arahant Sariyuth was able to speak 64 words, within the time we take to speak a word.

අපි වචනයක් කියනකොට ආනන්ද හාමුදුරුවොන්ට වචන **8** ක් කතා කළහැකියි. මේ බුද්ධ සාසනයේ අධික වේගය තිබුන තුන් දෙනා. සාමාන්‍යය කෙනෙක් වචනයක් කතා කරන වෙලාවට

With regard to the Venerable Ananda, it was 8 words. They were the three individuals who could speak much faster than the normal humans, that we come a cross in the Lord Buddha's dispensation.

වචන 8 ක වේගෙන් කතා කරන්න පුලුවන් ආනන්ද හාමුදුරුවොන්ට. සාමාන්‍යය කෙනෙක් වචනයක් කියනකොට වචන 64ක් කියන්න පුලුවන්, වේගයෙන් දේශනා කරන්න පුලුවන් සැරියුත් හාමුදුරුවන්ට,

Just imagine being able to speak 8 words. When a normal person speaks a word, the As I said earlier the Venerable Sariyuth could speak 64 words.

සාමාන්‍යය කෙනෙක් වචනයක් කියන වෙලාවට වචන 512 ක් කියන වේගයෙන් කතා කරන්න පුලුවන් ලොවුතුරා බුදුරජාණන් වහන්සේට. නමුත්, ලොවුතුරා බුදුරජාණන් වහන්සේ කියන දේශනාවක් තියෙනවා නම්,

The Lord Buddha could speak 512 words during the time it takes for a normal person to utter a single word. But it has no adverse impact on the understanding it creates in the listeners' minds.

පුංචි ළමයෙක් අහගෙන හිටියත්, කොච්චර වේගෙන් කිව්වත් තේරෙනවා. මේක අද හිතාගන්න බැරි, පුදුම සහගත දෙයක් වෙනවා මේ ශාස්ත්‍රය දන්නෙ නැති නිසා. මේකට අවශ්‍යය වෙන්නෙ,

Even a small kid can understand despite the speed at which they are uttered. This might sound inconceivable today, because we don't know much about the techniques that are operational in this regard.

ඒ ඒ උන්වහන්සේලා ඉදිරියෙහි ඇතිවන්නා වූ යම්කිසි කෙනෙක් ගෙ චිත්ත සමාධි ස්වභාවයයි, උන්වහන්සේලා ගේ වචන වල තියෙන පැහැදිලි බවයි. මොකද, ඒ කියන න්‍යාය ධර්මය ට අනුකූලව ම නිසා, ඇතිවන්නා වූ පැහැදිලි බවයි.

This is because of the peaceful nature of the minds of the listeners in the proximity of those great individuals and the clarity in their speech. Such clarity is derived directly from the doctrinal aspects.

මන්තෙ මේ තුලින් තමයි කනෙකුට වටහා ගන්න පුලුවන් කොච්චර වේගෙන් කිවුවත්. ඉතින් ඒ නිසා මේකෙදි අපි දකින්න ඕනෑ මේ බුදු ගුණ නවය කියන එක විස්තර කරලා එහමෙ ගන්න ගියොත් එහමෙ, ඕක කරන්න හම්බවනෙ එකක් නමෙයි.

Therefore, the speed at which they are uttered doesn’t adversely impact the clarity. We must understand that when it comes to the Nine Nobilities of the Lord Buddha, it isn’t possible to take one by one analyse them, try, and explain them.

එහනෙම් අපි දැනගන්න ඕනෑ මේ පද – පද වනේ වන්තෙ අර ක්‍රමානුකූලව ඒක කියන්න. “ඉතිපි සෝ හගවා අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජා චරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ…” ගාණට ම යන්න ඕනෑ

We need to know how to chant these expressions methodically one after the other. “Itipi so Bhagava, Araham, Samma-Sambuddho, Vijja-Carana Sampanno, Sugato, Lokavidu,

“…අනුත්තරෝ පුරිසදම්මසාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධෝ, හගවා ති” මුලයි, මැදයි, අගයි හඬ එක ගානට යන්න ඕනෑ, මේකත් තව එකක්. මුල, මැද, අග තුනේදිම ශබ්දය සමාන වන්තෙ ඕනෑ. දැන් සමහරකේ කියනකොට…

Anuttaro Purisa Dhamma Sarathi, Sattha Deva-Manussanam, Buddho, Bhagavati.” The beginning, the middle, the end all needs to have the same level of sound.

“ඉතිපි සෝ හගවා, අරහං, සම්මා…” මහොමත් යන ඒවා තියනෙවා. වචනයක්, දකෙක් සද්දයි, වචනයක් දකෙක් කන් තියාගනෙ ඉන්න ඕනෙ අහන්න. එහමෙත් දේශනා තියනෙවා.

Some people utter one expression with high sound and whisper another. The level of sounds alternates throughout the chant.

ඒවා ගැලපනේනෙ නෑ එකක්වත්, ඒවා එක එක ලතාවන්, රටාවන්, මේ ලෞකික කාම ලෝකේ මිනිස්සුන් ගෙ ඒ අදහස් වලට පුද්ගලයා නමන්න පුලුවන්, වසඟ කරන්න පුලුවන්.

These are not compatible with Dhamma understanding. Different melodies, patterns are useful to grasp the audience among the people who value sensuality as utmost.

එහමෙ තියනෙවා සාහිත්‍ය කලාවල්. ඒ සාහිත්‍ය කලාවල් හරියන්නෙ නෑ බුදු දහමට. බුදු දහම සමාධියනේ නැගනේන ඕනෙ එකක්. “සමාධි හඬ” යි සාහිත්‍ය කලා රසයයි කියන්නෙ දකෙක්.

Aesthetics is one thing. Buddha Dhamma is another. The Buddhism concerns with the Samadhi. The conforming sound is not like that of artistic melodies.

දැන් ඕක නිසා එක එක්කනොට එක එක විදිහට කියන්න පුලුවන්. දැන් යම්කිසි කනෙකේ මය …(ප්‍රසිද්ධ ගායකයකුගේ නමක් උදාහරණ ලසෙ ගනියි)… වගේ, පුද්ගලත්වයනේ නම කියන්න හොඳ නෑ,

Different people can utter the same thing. Suppose a famous singer is to utter the chant of the Nine Nobilities. It’s not good to say names of course.

නමුත් යම්කිසි, එබඳු යම්කිසි ආකාරයක දේශීය ගායකයෝ කියන්න පටන්ගත්තහම බලන්න ඒ ගාථාවක් එහමෙ කොහොමද කියන්නෙ කියලා, සමහර වලොවට ගාථාවක් කියලා ඉවරවනෙ මට්ටමට, එක අකුරක් අදිනවා.

But suppose some singer who is considered as a bit of a local sensation, he might sing it melodiously extending parts here and there to show case his singing capabilities.

එක එක විදිහට කියනවා, හරි ලස්සනයි, හඬ මිහිරියි, එහමෙ තියනෙවා. ඒ වුනාට ධර්ම අවබෝධයට ඒක ගැලපෙන්නෙ නෑ, සමාධියට ගැලපෙන්නෙ නෑ. අහං ඉන්න පුලුවන්, ඒවා ලෞකික සාහිත්‍ය සමාධියක් ලැබනෙවා.

It would be lovely, pleasant-sounding. But it wouldn’t ever facilitate the Dhamma understanding. One could listen for any amount of time. It would give an artistic samadhi.

මොකද "සමාධි" කියන ඒවා, **"මිත්‍යා සමාධි"** ත් තියනෙව නේ, **ලෞකික** සමාධි ත් තියනෙව නේ. **"ආර්ය** සමාධියක්**"** ලබන්න බෑ එහමෙ ගැයුවට. ඉතින් ඒ නිසා හරිආකාරව, දැන් ඔය පිරිත් කියනකොටත් අපි ඔය පුරුද්දද තියනෙවා.

There are “micca-samadhi”, which are worldly. The “arya-samadhi” or the noble samadhi isn’t brought about by them. The same habits are sometimes visible when it comes to chanting Pirith.

“ඒ….. වං……” කිය කිය හුඟාක් වලො ඇදි ඇදි ඉන්නවා ඉතින්, “මේ….. සුතං” ඒ ටික නිකං ම ගියා. අන්න එහමෙ එක එක රටාවල් තියනෙවා. ඕවා ඉතින් කියන්න ලස්සනට හෝ, යම්කිසි එක එක තාල රටාවල්, සාහිත්‍ය රටාවල් තියනෙවා,

“ Ae….. wan…..”. Like that some parts are overly extended. “Me..suthan”. That part would be uttered very swiftly. Different patterns are incorporated. Those would be fine in artistic endeavours.

හැබැයි පිරිතෙන් ලැබෙන්න තියනෙ **"චිත්ත සමාධිය"** ලැබෙන්නෙ නෑ. ඒකයි ඒ, හරියන්නෙ නෑ. “ඒවං මේ සුතං ඒකං සමයං භගවා…” එතකොට තමයි, ඒ තැනින් තැන අඩු-වැඩි වෙන්නෙ බෑ, ඒ සමාධි හඬකින් ම ගත්තොත් හරි ආකාර හඬ එනවා.

But with that, the peaceful mind expected from chanting Pirith wouldn’t be possible. “Aewang me suthang aekan samayan bhagava..”. When uttered this way consistently without overly extending or rushing through different parts here and there, that would facilitate the expected Samadhi.

ඒ හඬ අහ අහා ඉනකොට චිත්ත සමාධිය, අන්න උපක්‍රමයෙන්, අර කිළිටි රෙද්ද උපක්‍රමයෙන් පිරිසිදු කරනවා වගේ, කිළිටි හිත උපක්‍රමයෙන් පිරිසිදු වෙන්නෙ **හේතු** වනෙවා **"බුද්ධානුස්සති, ධම්මානුස්සති,** සං**ඝානුස්සති"** තුනම.

While we listen, we gain the inner peace, mindfulness. Similar to the dirty cloth, our minds get purified, through the recollection of the Buddha, Dhamma, Sangha (Buddhanussati, Dhammanussati, Sanghanussati).
දැන් ධර්මය සජ්ඣායනා කරනවා නම්, ඒ හඬ අහලත් කිරි වවුලො එතනින්, ඒ අත්බැවෙන් මිදිලා මනුස්සයෝ වලො උපන්නා, මුවෝ මනුස්සයෝ වලො උපන්නා කිවුවෙ, අන්න ඒ "ගති **හඬ"** අහලා, උන්ට අදහස් තේරෙන්නෙ නෑ.

We have heard of the instances, where even the bats, deer getting rid of their animal beings and being born as humans because of listening to Dhamma chants.

නමුත් උපක්‍රමයෙන් කිළිටි හිත පිරිසිදු කරනවා කිව්ව බුද්ධ දේශනාව හොඳට පැහැදිලි වෙන දෙයක් තමයි කිරි වවුලෝ 500ක්, මුවෝ 500ක්, මෙහෙම බණ අහලා, එතනින් මැරිලා ඇවිදිල්ලා මනුස්සයෝ වෙලා උපන්නා කියලා අපේ ධර්මයේ තියෙනව නේ,

Tactically the minds get purified. It is mentioned that some 500 bats, 500 deer were able be born as humans after their death because of listening to Dhamma chants.

අන්න ඒ තියෙන්නෙ හේතුව ඒකයි. "මණ්ඩූක" දිව්‍ය පුත්‍රයා, බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්න කාලේ, උන්වහන්සේගේ ශබ්දය අහලා, අර ගොපළු කොළුවා ගේ කෝටුවට හිරවෙලා මැරිලා, එවෙලෙමෙ දෙවියෙක් වෙලා ඉපදිලා,

That’s how it was possible. In the case of the Maṇḍuka Devaputta, a frog was absorbed in the sound of the Dhamma speech, was killed accidentally, and was reborn in the deva realm.

ඒ ඉතුරු බණ අහන්න ම දේව අත්බැවයෙන් අහලා, සෝවාන් ඵලයට පත්වෙලා ගියා කියලත් තියෙනවා. දැන් එතකොට එතනින් හොඳටම පේනවා තිරිසනා ට ධර්මය තේරිලා නෙමෙයි එතෙන්ට පත්වුනේ.

And that deva returned to listen to the part he missed and became a sotapanna. The animal could not understand the Dhamma of course.

හැබැයි "ගති **හඬ**" ඇසුරු කරගෙන, අන්න උපක්‍රමයෙන් කිළිටි හිත පිරිසිදු වෙන ක්‍රමය. ඉතින් ඒ නිසා පිරිත් හඬ, ධර්ම සජ්ඣායනා හඬ බොහොම වැදගත්, ඒක ඒ රටාවට යන්න ඕනෑ.

But he was able to associate with the innate sound of the Dhamma speech and tactfully was able to cleanse its mind to a certain extent. Therefore, the sound of the Pirith or the Dhamma speech of great value. The innate audio pattern must be present.

ඉතින් ඒකෙන්, මේ නවගුණ ගාථාව විස්තර කරන්න යන්න ඉස්සෙල්ලා මේ ක්‍රමය දැනගන්න ඕනෑ, පද වෙන් වෙන්න, ඔය කරන ක්‍රමයට, ඉක්මණට කියන්නත් පුලුවන්, ඇදලා කියන්නත්, බොහොම හෙමින් කියන්නත් පුලුවන්,

Therefore, before going in to analysing what the Nine Nobilities are, we should be able to chant each expression separately, keeping the appropriate pace, slowly or fast as appropriate.

ඉතින් ඕනෑ විදිහට කියන්න පුලුවන්. හැබැයි කිව්වට, අර අක්ෂර – **ඝන** රටාව හරියට තියෙන්න **ඕනෑ**, ඒකයි කාරණය. "ඉතිපි සෝ හගවා, අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජා වරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ…"

We can chant the way we want. But the proper linguistic and phonetic patterns should be complied with. That’s the key. “Itipi so Bhagava, Araham, Samma-Sambuddho, Vijja-Carana Sampanno, Sugato, Lokavidu...”

ඒත් යන්නෙ ඒ ගාන මයි, ඒකෙත් අක්ෂර හරියටම ගන්න කාලය වෙන් කරලා බැලුවොත් අර ගාණට ඒ ගණන යනවා. "ඉතිපි සෝ හගවා, අරහං, සම්මා සම්බුද්ධෝ…" ඒ ගාණටත් ගිහැකි. ඒත් වචනයේ අකුරක් ගානෙ තේරෙනවා.

The counts for each letter and temporal patterns of sound levels are still consistent. “Itipi so Bhagava, Araham, Samma-Sambuddho…” We can use this tempo as well. Still the clarity is there with each letter.

“ඉතිපි සෝ හගවා, අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජා චරණ සම්පන්නෝ…” ඒත් යනවා, ඒත් අකුරක් ගානෙ තේරෙනවා. ඉතින් ඒක සමාධියකට **ගෝචර** වෙච්ච **හඬකට** තමයි ඒ ශබ්ද රටාව ගෝචර වෙන්නෙ.

““Itipi so Bhagava, Araham, Samma-Sambuddho, Vijja-Carana Sampanno…”. Still sounds fine. The sound pattern is compatible to the Dhamma samadhi,

එතකොට අනික් අය මොකද කරන්නෙ, අන්න “කල්‍යාණ මිත්‍ර සම්පත්තිය” කියන්නෙ ඒ ශබ්දය ට සවන් දීගෙන ඉන්නවා. සවන් දීගෙන ඉන්නකොට ක්‍රමාණුකූල ව චිත්ත පාරිශුද්ධිය නැඟිලා,

This is how the association with a Kalyana mitta or a spiritual friend become useful. The others listen to the kalyana mitta and gradually the purification of the mind takes place.

ඒ හිතත් සමාධිගත වෙනවා, අර කියන හඬට ගැළපෙන්නෙ. ඊට පස්සෙ, මේක තමයි කිවුවෙ බුදුරජාණන් වහන්සේගේ කාලයේදි නම් “ශ්‍රවණය තුළින් දරාගෙන ගෙනාපු, මුඛ පරම්පරාවෙන් ධර්මය ගෙනාපු” ක්‍රමයක් තිබුණා කියලා.

Thus, the minds of the listeners too become tranquil. In the times of the Lord Buddha, there was a tradition of bringing down Dhamma from generation to generation by listening to Dhamma and relaying to the others by word of mouth.

ඒ ක්‍රමය එනකන් “ගති හඬ” හරියට ආවා, “ගති සමාධිය” ඒ ගෝල ශ්‍රාවකයන්ට මතුවුනා. උන්වහන්සේලා ට ඒ සමාධිය නැඟුනාට පස්සෙ අර හඬ රටාව වෙනස් වුනේ නෑ, ඒක හරියටම ආවා.

The innate sound attributes remained intact with this method and the innate samadhi emerged in the minds listening student monks. Since they too achieved the innate samadhi the innate sound patterned wasn’t compromised.

යම් කාලෙකදි ඒවා විනාස වෙලා ගියාට පස්සෙ, නැවත යළි ගොඩනඟාගන්නකොට ඒවා නෑ. ඒ හෙළ අටුවා ත් නෑ, ඒ ක්‍රම ත් නෑ, ඒ හින්දා එක එක්කෙනා, තම තමන්ගේ සාහිත්‍ය රසයන්ට අනුකූලව පිරිත් කියන්න පටන්ගත්තා,

After some time, those methods came to a halt and it wasn’t possible to revive them in the absence of Sinhalese commentaries. Without a proper guide, different individuals started chanting, incorporating aesthetic add-ons.

හාවිතා කරන්න පටන්ගත්තා. ඒකෙන් ඇතිවුනු වෙනස තමයි අද මේ බලපාලා තියෙන්නෙ. ඉතින් මේකෙදි අප්‍රමාණ බුදු ගුණ විස්තර කරන්න යන්න අවශ්‍යය නෑ, මේක එක්තරා විදිහක උපක්‍රමයක්.

It became a practice and with time the pronunciation of chants became distorted. See we don’t need to get the infinite nobilities of a Lord Buddha clarified. But we can use them strategically.

“භයක්, තැති ගැන්මක්, ලොමු දැහැගැන්මක් ඇතිවෙච්ච වෙලාවට මා මෙනෙහි කරන්න, ඔබලාගෙ බය, තැතිගැනුම් නැතිවෙලා යනවා. කුමක් නිසාද? තථාගතයන් වහන්සේ රාගක්ෂයයි, ද්වේෂක්ෂයයි, මෝහක්ෂයයි, බය නෑ,

“Should there be the arising of fear, terror, or horripilation, then on that occasion you should recollect me. Whatever fear, terror, or horripilation there is will be abandoned. The Blessed one is devoid of passion, devoid of aversion, devoid of delusion.

තැති ගන්නෙ නෑ, පලා යන්නෙ නෑ. මගේ නිසයි ඔබලාටත් එහෙම ශක්තියක් ලැබෙන්නෙ” කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ. මගේ අපේ හිත තුළ රැකවරණය හම්බුනා. ගුණය අපි අර ගුණ වලින් කිවුවා.

He doesn’t feel fear, terror nor dread. He doesn't run away. That’s how you’d get empowered”. The Lord Buddha preached so. And when we recollected the Lord Buddha with the Nine Nobilities, we felt secure.

අපේ කතාවක් තියෙනවා, එක්තරා ළමයි දෙන්නෙක්, ඒ කියන්නෙ අන්‍ය ලබ්ධික පිරිසක, පවුලක ළමයෙකුයි, බෞද්ධ දරුවෙකුයි. මේ දෙන්නෙක් එක්කලා භාවිතා කළා බුදු ගුණයක්.

There is a story that we know of. There were two kids. One kid belonged to a Buddhist family and the other to some other religion. The two of them had used one Nobility.

මේ ළමයි දෙන්නා සෙල්ලං කරනකොට **“නමෝ** බුද්ධාය**!”** කියලා අර බෞද්ධ ළමයා කියනවා. එතකොට ඒ ළමයා දිනනවා, අර ළමයා පරදිනවා. ඔහොම ඉන්නකොට අර අන්‍යාගමික ළමයා එයාගෙ තාත්තත් එක්කලා සැවැත් නුවරට ගියා ලු

When they were playing, the Buddhist kid used to utter “Namo Buddhaya” and he became victorious over the other kid. And this other kid happened to go to the city of Savat.

බඩු වගයක් මොනවා හරි ගේන්න, හවස් වෙලාවෙ. හරියට ඒ හවස 6 ට, නැත්තම් ඒ වෙලාවට දොර වහනවා, ආයි ඊළඟ දවසෙ උදේ තමයි නුවර දොර වැහුවම ආයි අරින්නෙ. හතුරන් ගෙන් ආරක්ෂාවට කරන වැඩක්, ඒක.

To buy some good may be. The city gates are closed at six in the evening. The doors would open only in the next morning. This took place due to security reasons.

ඉතින් මේ වෙලාවෙදි ඒ කාලෙ තිබුණ ක්‍රම තමයි, දොර වහලා, යක්ෂ සේනාධිපතින්ට පවා පවරණවා ඒවා ආරක්ෂා කරන්න. ඒ කාලෙ තිබ්ච්ච එක්තරා, අර ආධ්‍යාත්මික ක්‍රම, ගුප්ත ක්‍රම.

Those days once the doors are closed, the responsibility for the security of the city was handed over to the demons. Some hidden magical method.

ඉතින් මේ දොර වහපුහම ඒ යක්ෂයින්ට පවරපු වෙලාව, ආයිත් ඊළඟ දවස වෙනකන් යක්ෂයො තමයි මේක ආරක්ෂා කරන්නෙ. එතනේට එන්න දෙන්නෙ නෑ, සැඩ එරුෂ යක්ෂයො යොදවලා තියෙනවා ඒ වගේ වෙලාවට, ඒක ඉතින් එක්තරා ගුප්ත රටාවක්.

Once the demons have been put in charge, they wouldn’t allow anybody to enter the city. Those demons were so fierce. Bit of a mystical method used those days.

දැන් මගේ ළමයා එළියතේ තියලා, වෙලාවට ඉස්සෙල්ලා මොකද කරන්නෙ, මොනවා හරි බඩුවක් ගේන්න අමතක වෙලා, “පුතා ඔතන ඉන්න මම ගිහිල්ලා එනකන්” කියලා තාත්තා ගියා ඇතුළට.

The kid happened to be outside the city gates and the father had returned to the city get something he had forgotten.

යනකොටම අර දොර වැහුවා, මතක නැති වුනා වෙලාව. දැන් ළමයා එළියෙ, තාත්තා ඇතුළෙ. ඊළඟ දවසෙ එළි වෙනකන් මොන හේතුවකට වත් ආයි දොර අරින්නෙ නෑ. දැන් රෑ වෙනකොට අර ළමයට කරන්න දෙයක් නෑ,

While he was in, the gates were closed. The father lost track of the time and he could not come back till the dawn. The kid was on his own outside.

අර එතන තිබ්බව වාසල කවුළුව ළඟ ම කණුවකට හේත්තු වෙලා ළමයා එහමේමම ඉන්නකොට, එක්තරා යක්ෂයෙක් දැකලා, මේ ළමයා ව බිලි ගන්න ආවා. දැන් මයොට කරන්න දෙයක් නෑ, බේරෙන්න මොකුත් දෙයක් නෑ.

He went to the closed gate and was leaning against a post. A demon encountered the kid and wished to come and eat the kid. The kid was so helpless, nowhere to run.

මයො මොකද කරන්නෙ, දැන් තමංගෙ අර යාලුවා දිනපු හැටි දන්නවා කරදරයක් ආපුහාම. “නමෝ බුද්ධාය” කියලා දිනුවේ. ඒ කියන වචනෙ මතකයි, වෙන මොනවත් අර්ථයක් දන්නෙ නෑ. **“නමෝ බුද්ධාය! නමෝ බුද්ධාය! නමෝ බුද්ධාය!”** කිවුවා.

He recollected how his friend won the games and he realised that those words uttered by his friend has led to some support. Without even knowing what it means, he uttered “Namo Buddhaya! Namo Buddhaya! Namo Buddhaya!”.

අර යක්ෂයා වෙවුලන්න පටන් ගත්තා. මිනිස් වෙසේ මවාගෙන, එයාගෙ පියාගෙ වෙසේ මවාගෙන ඇවිදිල්ලා, එළි වෙනකන් ළමයාව ආරක්ෂා කරලා දීලා, උදේ තාත්තා එනකොට ම එයා අතුරුදහන් වෙලා යන්න ගියා.

The demon started to tremble and shifted his appearance into the kid’s father. He was there to comfort the kid till the dawn and disappeared once the real father approached.

දැන් එතකොට ඒ ළමයා **“බුද්ධ”** කියන ඒ වචනයේ අර්ථය දැනගෙන ද ඒක කිවුවෙ? අන්‍යාගමික ළමයා, අර සම්‍යක් දෘෂ්ටික ළමයා කිවුව “නමෝ බුද්ධාය!” කියන වචනය විතරයි අහගත්තෙ. ඒ වචනෙ ආරක්ෂාව ලැබුණෙ නැද්ද?

Did this kid know the meaning of the word “Buddha”? This kid happened to utter some word that was used by his Buddhist friend. But didn’t it give him security?

දැන් මෙහෙම දේවල් තියෙනවා. ඒ කාලෙ එහෙම දේවල් වාගෙම මේ කාලෙ අපතේ අත්දැකීම් තියෙනවා. බණ ගැනවත්, ඕවා ගැන හොයපු නැති එක්තරා වයසක මහත්මයෙක් මළා,

There are these sorts of things. Even today, we happen to have some experiences. There was some old person, who had no concern towards Dhamma. He died.

මැරෙන්න කිට්ටුවෙනෙ වෙලාවෙදි එයා දන්නෙ **“ඉතිපි සෝ** හගවා අරහං**..”** විතරයි. ඊට එහා කියන්න, නවගුණ ගාථාව වත් සම්පූර්ණව කියන්න දන්නෙ නෑ. ඉතින් එයාට කනට කරලා කිව්වා “නවගුණ ගාථාව මතකද?” කියලා අහපුහාම “මතකයි” කිව්වා,

He knew only to say “Ithipi so bhagava Araham”. He didn’t even know the rest of the Nine Nobilities chant. In his death bed, he was asked whether he knew the Nine Nobilities chant. He said that he knew.

“කියන්නකෝ…” ඉතින් “ඉතිපි සෝ හගවා අරහං, ඉතිපි සෝ හගවා අරහං…” කියාගෙන මළා. ඒ කතාවෙන් ම හිටියා, ඒ කතාවෙන් ම මළා. නමුත් ඉතින් මේවා කිව්වට ලෝකයා දන්නෙ නෑ වෙන්නෙ මොකද්ද කියලා.

When he was asked to recite, he uttered “Ithipi so bhagava Araham. Ithipi so bhagava Araham”. While he was uttering these words, he died. No one knew what happened next.

වෙන පිනක් මොනවත් අපි දැනුවත් ව කරපු කෙනෙකුත් නෙමෙයි, විශේෂ පිං කරන්න ගිය කෙනෙකුත් නෙමෙයි, ඒ එක දවසක් වත් සිල් ගත්ත කෙනෙකුත් නෙමෙයි, රිදී පාට කයක් **ඇති දේවතාවෙක්** වෙලා උපන්නා.

We had no idea of any other merit that this old man had done. Wasn’t religious when he was alive. Never observed the eight precepts. But he was born as a Deva with a silver complexion.

ඉස්සර කථාවක් නෙමෙයි, ඉතා මෑත සිද්ධියක් ඔය. එයාගෙන් අහපුහාම “කොච්චර කාලයක් ඔය අත්බැව තියෙනවද?” කියලා, “සාසනේ පවතින කල් **මේකෙ** ඉන්නවා” කිව්වා.

This didn’t happen long back. It happened very recently. When asked for how long he would remain as a Deva, he told his lifetime would span until the end of the Buddha’s dispensation.

එයාට පේනවා කිව්වා සාසනය පවතින තුරු ම, ඒ කියන්නෙ කවදා හරි එයා අරිහත්වයට පත්වෙන්න හේතු වාසනා, නැත්නම් නිවන් දකින්න හේතු වාසනාවක් ලබන බුද්ධාන්තරයක් ඇවිදිල්ලා,

He said that he can foresee that his life would span until the end of the Buddha’s dispensation. If he doesn’t have causal eligibility to attain Nirvana, until the appropriate Buddha’s dispensation come in to being,

ඒ ටික කරගන්නකල් ම ඒ අත්බැවෙන් චුත වෙන්නෙ නෑ. දැන් බලය මොකද්ද ලැබුණෙ? තමං අර්ථය නොදැන නමුත් අර නවගුණ ගාථාව අර පොඩ්ඩ කීම, “අරහං” කීම**,** “අරහං” කියන ගුණය කියවෙච්ච බලය, ඒ පුන්‍යය මහිමය ඒ…

he said he’d remain as a Deva. Where did that energy come from? That was the merits of uttering the Nobility of “Araham”, even without know what it meant possibly.

එහෙනම් මේක අපි, මේකෙ වටිනාකම දකින්න ඕනෙ, ඒක තමයි කියන්නෙ බුදුරජාණන් වහන්සේ, “හයක්, තැති ගැන්මක්, ලොමු දැහැගැන්මක් ඇතිවුනොත් මෙසේ මා මෙනෙහි කරන්න, මා මෙනෙහි කරන ඔබට,

From this we should see how valuable the Nine Nobilities are. This is why the Lord Buddha happened to say this way. “Should there be the arising of fear, terror, or horripilation, then on that occasion you should recollect me.

ඒකාන්තයෙන් ම භය තැතිගැනුම්, ලොමු දැහැගැනීම් නැති වෙනවා”. එහෙනම් සංසාර භය නැති කරගන්නත් ඒක උදවු දෙනවා, එච්චර වටිනවා. ඉතින් මෙසේ අර්ථ කරන්න ගියොත් එහෙම,

Whatever fear, terror, or horripilation there is will be abandoned”. It would also be of use to get rid of the fear arising from attaching to the samsara. It’s of great use.

අපිට කරන්න බැරි දෙයක් කරන්න ගිහිල්ලා අමාරුවෙ වැටෙන්න පුලුවන්. ලොවුතුරා බුදුරජාණන් වහන්සේ වත් විස්තර කරන්න බැරි එකක් අපිට තත්පර ගානෙන් විස්තර කරලා ඉවර කරන්න පුලුවන්ද?

We might even get into trouble by trying to do something impossible. Even a Lord Buddha wouldn’t be able explain the Nobilities of a Lord Buddha in a few seconds like we are trying to do.

“රහසින් වත් පවු නොකරන හයින්, වාසනාවන්ත – වාසනා කෙලෙසේ දුරු කරපු හයින්, පූජාවට සුදුසු වූ හයින්, අරහං කියන්නෙ” අපි කියලා ඉවරයි. දැන් එතකොට මොකද වෙන්නෙ? මෙන්න මේ වගේ තැන් වලදි අපි පරිස්සම් වෙන්න ඕනෙ.

We have already interpreted the word Araham as the one who doesn’t commit a sin even in hiding, the one who has diminished even the past impressions, the one who is worthy of offering. These are the kind of traps we need to be aware of.

ඒ නිසා මේ බුදු ගුණ ගාථාව ගුණ නමය වෙන් වෙන්න, ඔය කියන විදිහට හෙමින් හෝ වේගයෙන් හෝ කර්මස්ථානයක් වශයෙන් වඩලා එහෙම හුරු කරගන්න ඕනෙ. මේක උපක්‍රමයෙන් හිත පිරිසිදු කරගන්න එකක්.

We just need to utter the nine expressions of the Nine Nobilities chant separately, slowly, or faster as a meditational phrase. After practising for while it would tactically begin to cleanse you mind.

චතුරාර්ය සත්‍යය පිළිබඳ දහම් අහලා, නිවනට මාර්ගය පාදාගන්න ඕනෙ. ආරක්ෂාවක් වශයෙන් අර බුදු ගුණ සිහි කරගත්තහම ඇති. දැන් ගුණ සිහි කරලා, ගුණ ගැන අර්ථ විග්‍රහ කරගෙන නෙමෙයි අපි නිවන් දකින්නෙ.

We need to listen to Dhamma about the four Noble Truths and uncover the Path to Nirvana. Recollecting the Nine Nobilities of the Lord Buddha for safety would suffice. We don’t attain Nirvana, by recollecting each expression, by analysing each expression.

නිවන් දකින්න චතුරාර්ය සත්‍යය පිළිබඳව අවශ්‍යය කාරණා අහගන්න ඕනෙ. අනිච්ච, දුක්ඛ, අනත්ථ පිළිබඳව විග්‍රහ කරගන්න ඕනෙ. ඔන්න ඔය ටික ගැන විග්‍රහ කරගත්තොත් අපිට පුලුවන් ඔය කියන තත්වය ලබාගන්න.

To attain Nirvana one needs to listen to Dhamma about the four Noble Truths. We need to get anicca, dukka, anatta clarified to attain Nirvana.